සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 25 | S | I |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය .............................

# ලංකා ඉතිහාසය I

කාලය පැය එකයි.

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## 1 කොටස

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. ගම්භිර නදී 2. උතුරු මාමිණියා 3. දකුණු මාමිනියා 4. කනදරා ඔය 5. කොත්මලා ඔය (.....)
02. 1. මහාතිත්ථ 2. ගෝකණ්ණ 3. බදලත්තලී 4. ඌරාතොට 5. ජම්බුකෝළ (.....)
03. 1. සිලප්පදිකාරම් 2. තිරුවාලංගාඩු 3. මණිමේඛලෙයි 4. පට්ටිනප්පාලෙයි 5. පදිර්රුප්පත්තු (.....)
04. 1. රජගල ලිපිය 2. ගල් විහාර ලිපිය 3. සංගමු ලිපිය 4. දෙවනගල ලිපිය 5. අඹගමු ලිපිය (.....)
05. 1. තම්බපණ්ණි 2. උරුවේල ග්‍රාම 3. අනුරාධ ග්‍රාම 4. උපතිස්ස ග්‍රාම 5. දීඝ ගාම (.....)
06. 1. නර ඉසෙර 2. දෙවන පිය 3. කාලිංග චක්‍රවර්තී 4. අලකපය 5. සිරිසගබෝ (.....)
07. 1. ථූපාරාම දාගැබ 2. පොත්ගුල් විහාරය 3. ලංකාරාමය 4. ඉසුරුමුණිය 5. වෙස්සගිරිය (.....)
08. 1. මාස 2. එළාර 3. සේනගුත්තික 4. භල්ලුක 5. සත්ද්‍රවිඩ (.....)
09. 1. ගම්පොල 2. සිදුරුවාන 3. සීතාවක 4. දෙනුවර 5. මාතලේ (.....)
10. 1. හියුබොයිඩ් 2. ලොරෙන්සෝද අල්මේදා 3. ජෝන් ෆයිබස් 4. මැක්ස්වෙල් 5. බාබට් (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් පද යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇතිවරහන තුළ ලියන්න.**

11.
1. ෆර්නාඕ ඩී ක්වේරෝස් - ලංකාධිපත්‍ය
2. බැල්දියස් - ලංකා පුරාවෘතය
3. රොබට් නොක්ස් - එදා හෙළදිව
4. ජුවාම් රිබෙයිරෝ - ලංකා ඉතිහාසය
5. ආර්.එල් බ්‍රොහියර් - සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඩු සටහන් (.....)

12.
1. හැබැස්ස ලිපිය - දස මහා යෝධයින් පිළිබඳ තොරතුරු
2. කුසලාන කන්ද ලිපිය - ප්‍රාදේශීය රජවරුන් පිළිබඳ තොරතුරු
3. කදුරුවෙල ලිපිය - ඇමති පරම්පරා පහක් පිළිබඳ තොරතුරු
4. රජගල ලිපිය - ධර්මදූතයන් වහන්සේලා පිළිබඳ තොරතුරු
5. වෙස්සගිරිය ලිපිය - වගා කළයුතු ධාන්‍ය පිළිබඳ තොරතුරු (.....)

13. 1. පළමු සේන රජු - ශ්‍රී මාර ශ්‍රී වල්ලභගේ ආක්‍රමණය
2. පස්වන කාශ්‍යප රජු - දම්පියා අටුවා ගැටපදය රචනා කිරීම.
3. හතරවන මහින්ද රජු - සිරිය වේලාර්ගේ ආක්‍රමණය
4. පස්වන මිහිඳු රජු - රාජ රාජගේ ආක්‍රමණය.
5. දෙවෙනි සේන රජු - චෝළ දේශය ජයගැනීම. (.....)

14. 1. ධාතුසේන - කාශ්‍යප
2. මහාසාමි මොග්ගල්ලාන - පළමුවන විජයබාහු
3. මාණාභරණ - පළමු පැරකුම්
4. පළමු විජයබාහු - දෙවන ගජබාහු
5. ජයපාල මහීපතී - හයවන පැරකුම් (.....)

15. 1. සිද්ධි ලෙබ්බේ මහතා - මද්‍රාසා පාසල් ආරම්භ කිරීම.
2. ශ්‍රී ආරුමුග නාවලර් තුමා - ශෛව ප්‍රකාශ සභා පිහිටවීම.
3. අනගාරික ධර්මපාල තුමා - පරම විඥානාර්ථ සමාගම පිහිටවීම.
4. සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මහතා - නිදහස් අධ්‍යාපනය
5. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි - වාද විවාද පැවැත්වීම. (.....)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දැක්වෙන සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

| | **X** | | **Y** |
|---|---|---|---|
| 16. | 1. අරවි ආරු | A | කලා වැව |
| | 2. කනගරායන් ආරු | B | ඉරණමඩු වැව |
| | 3. ගාල්හ නදී | C | නාච්චදූව වැව |
| | 4. ගෝන නදී | D | හුරුළු වැව |
| | 5. යාන් ඔය | E | ගල් ඔය |

1. BCEAD 2. CBEAD 3. BCEAD 4. DABCE 5. ABCDE (.....)

| | **X** | | **Y** |
|---|---|---|---|
| 17. | 1. සද්ධර්මාලංකාරය | A | සීලවංස ධම්මකිත්ති හිමි. |
| | 2. පාරමී මහා ශතකය | B | ජයබාහු ධම්මකිත්ති හිමි. |
| | 3. සරජෝති මාලෙයි | C | රාජගුරු ධම්මකිත්ති හිමි. |
| | 4. දඨාවංශය | D | ධම්මදින්න විමලකිත්ති හිමි. |
| | 5. සද්ධර්ම රත්නාකරය | E | තේනුවරෙයි පෙරුමාල් |

1. DCBAE 2. BAECD 3. BACED 4. CDBAE 5. ABCED (.....)

| | **X** | | **Y** |
|---|---|---|---|
| 18. | 1. වේදය කුමරු | A | හයවන බුවනෙකබාහු |
| | 2. චක්‍රායුධ කුමරු | B | වීදිය බණ්ඩාර |
| | 3. දොන් ජුවන් ප්‍රොපෙන්දරා | C | පළමුවන රාජසිංහ |
| | 4. ටිකිරි කුමරු | D | විජයබාහු |
| | 5. සෙම්ගබ්බ පෙරුමාල් | E | ධර්මපාල රජු |

1. BDECA 2. DEBCA 3. ECADB 4. BDCEA 5. DBCAE (.....)

| | X | | Y |
|---|---|---|---|
| 19. | 1. හැඳ බද්ද | A | විවීමේ කාර්යාංශය |
| | 2. කින්නර බද්ද | B | අලි ඇතුන් පිළිබඳ කාර්යාංශය |
| | 3. බඩහැල බද්ද | C | කුඹල් කාර්යාංශය |
| | 4. කුරුවෙ බද්ද | D | රෙදි විවීම |
| | 5. මඩිගෙ බද්ද | E | ප්‍රවාහන කාර්යාංශය |

1. ADCEB  2. CDABE  3. ABCDE  4. DACBE  5. DABCE (.....)

| | X | | Y |
|---|---|---|---|
| 20. | 1. 1803 උඩරට ආක්‍රමණය | A | වෛයිකවුන්ට් ටොරින්ටන් |
| | 2. 1815 උඩරට ආක්‍රමණය | B | ෆෙඩ්රික් නෝර්ත් |
| | 3. 1848 කැරැල්ල | C | කෝල්බෲක් |
| | 4. දිවයින පළාත් 5කට බෙදීම | D | චාල්ස් හේ. කැමරන් |
| | 5. ඒකීය අධිකරණ පද්ධතියක් ඇතිකිරීම. | E | රොබට් බ්‍රවුන්රිග් |

1. BEACD  2. EBACD  3. ACDBE  4.ABCDE  5. ABEDC (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා, ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. දීප වංශය,
    1. පාලි භාෂාවෙන් රචිත වංසකතාවකි.
    2. දැනට ඉතිරිව ඇති පැරණිතම වංසකතාවයි.
    3. ක්‍රි.ව. 4-5 සියවස්වල දී ලියවෙන්නට ඇතැයි විශ්වාස කෙරේ.
    4. පුනරුක්ති දෝෂ බහුලව දක්නට ලැබේ.
    5. දීප වංශයේ දෙවන කොටස චූල වංසය ලෙස හැඳින්වේ. (.....)

22. වාරිමාර්ග,
    1. මුල් ඓතිහාසික යුගයේදී කුඩා ගම් වැව් ඉදිකරන ලදී.
    2. වැව් ඉදිකිරීම සඳහා මුලින්ම රාජ්‍ය අනුග්‍රහය දැක්වූ පාලකයා වූයේ වසභ රජුය.
    3. ධාතුසේන රජතුමා විසින් ජය ගඟ හෙවත් යෝධ වැව ඉදිකරන ලදී.
    4. පැරකුම් රජතුමා විසින් තෝපා, එරඹදු, දුඹුටුළු වැව් ඒකාබද්ධ කරමින් පරාක්‍රම සමුද්‍රය ඉදිකරවන ලදී.
    5. වැවට ලැබෙන අතිරික්ත ජලය පිටකරනු ලැබුයේ පිටවාන මගිනි. (.....)

23. ගම්පොළ රාජධානිය,
    1. හතරවන බුවනෙකබාහු රජු විසින් අරඹන ලද රාජධානියකි.
    2. ඉබන් බතුතා ලංකාවට පැමිණි අවධියයි.
    3. මීට සමගාමීව දැදිගම කේන්ද්‍ර කරගනිමින් පස්වන පැරකුම් රජු පාලන කටයුතු මෙහෙයවන ලදී.
    4. සේනාධිලංකාර සෙනෙවි විසින් ලංකාතිලක විහාරය ඉදිකරවන ලදී.
    5. සේනාධිලංකාර සෙනෙවි විසින් කොළඹ කොටුව ඉදිකිරීම. (.....)

24. පෘතුගීසීන්ගේ සමාජ සංස්කෘතික බලපෑම,
    1. පැරිස් පාසල් ආරම්භය.
    2. එස් පිරිටල් නම් කුඩා රෝහල් ඉදිකිරීම.
    3. දේවස්ථාන කේන්ද්‍ර කරගනිමින් මඩම නම් සමාජසේවා ආයතන පිහිටුවීම.
    4. ප්‍රොතෙස්තන්ත්‍ර හෙවත් රෙපරමාදු ආගම ව්‍යාප්ත කිරීම.
    5. අච්චාරු, විනාකිරි ආදී ආහාර වර්ග ප්‍රචලිත වීම. (.....)

25. කීර්ති ශ්‍රී රාජසිංහ,
 1. නායක්කර් රාජ වංශිකයෙකි.
 2. වීර පරාක්‍රමබාහු නරේන්ද්‍රසිංහ රජුට පසුව උඩරට රාජ්‍යත්වයට පත්විය.
 3. නෙරෙනප්පා නායක්කර් ගේ පුත්‍රයා විය.
 4. වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනමන ලදී.
 5. පෘතුගීසීන් පලවා හැරීම සඳහා ජෝන් පයිබස්ගේ සහාය ලබාගැනීමට උත්සාහ දරන ලදී. (.....)

- **අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති A, B, C හා D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

 A සහ B පමණක් නිවැරදිනම් 1 ද,
 B සහ C පමණක් නිවැරදි නම් 2 ද,
 C සහ D පමණක් නිවැරදි නම් 3 ද,
 A සහ C පමණක් නිවැරදිනම් 4 ද,
 ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිනම් 5 ද වරහන තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
 (A) ක්‍රි.පූ. 600 - 500 කාල වකවානුව මෙම යුගයේ ආරම්භය ලෙස සැලකේ.
 (B) ඉන්දියාවේ සිට විවිධ ජන කොටස් ලංකාවට සංක්‍රමණය වූ අවධියකි.
 (C) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ මුල් ජනාවාස ව්‍යාප්ත විය.
 (D) ආර්යයන් ලංකාවට පැමිණෙන විට මෙරට සංවිධානාත්මක සමාජයක් පැවතී ඇත. (.....)

27. තුන්වන විජයබාහු රජතුමා සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
 (A) මුලින් වන්නි පාලකයෙකු ලෙස කටයුතු කළ බව පූජාවලියේ සඳහන් වේ.
 (B) ජම්බුද්‍රෝණිය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරාගන්නා ලදී.
 (C) කාලිංග මාඝ පරාජයට පත්කරන ලදී.
 (D) පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙන කරවන ලදී. (....)

28. යාපහුව රාජධානිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
 (A) දෙවන නාගරීකරණය අයත් පළමු අගනගරයයි.
 (B) ආරම්භක පාලකයා වූයේ දෙවන පැරකුම් රජුය.
 (C) කාලිංගරායර හා චෝඩංග ගේ ආක්‍රමණ එල්ල වීම.
 (D) ඊජිප්තුව සමඟ සබඳතා ගොඩනගා ගැනීම. (.....)

29. මහනුවර රාජධානියෙහි සමාජ ආර්ථික හා සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේද?
 (A) රාජ්‍ය පාලනයේ ප්‍රධානියා රජු ය.
 (B) පාලන කටයුතු සම්බන්ධව මහ අධිකාරම්වරු තිදෙනෙක් පත්කර සිටින ලදී.
 (C) ඉහළම උසාවිය ''මහනඩුව'' නමින් හැඳින්වේ.
 (D) රාජ්‍ය ද්‍රෝහි චෝදනා විමසීමේ බලය හිමිවූයේ මහ අධිකාරම් වරයාට පමණි. (.....)

30. 1797-98 මුහුදුබඩ ප්‍රදේශයේ ඇති වූ බ්‍රිතාන්‍ය විරෝධී අරගලය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
 (A) රාජකාරි ක්‍රමය අහෝසි කිරීම. (B) බදු එකතුකිරීම සඳහා අවුමිල්දාර්වරු පත්කිරීම.
 (C) මුදලින් බදු ගෙවීමට සිදුවීම. (D) ගම්සභා ක්‍රමය පිහිටවීම. (.....)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. ඉතිහාසයේ පියා ලෙස හඳුන්වනු ලබන්නේ කවුරුන්ද?
1. ඇරිස්ටෝටල් 2. පයිතගරස් 3. කොලොන්ජන් 4. හෙරඩෝටස් 5. ක්‍රිස් හර්ට්ස් (.....)

32. වල්ලිපුරම් සන්නසට අනුව ඉසිගිරිය අමාත්‍යවරයා විසින් නකදීව ප්‍රදේශයේ කරවන ලද විහාර කර්මාන්තය කුමක්ද?
1. වෙල්ගම් විහාරය 2. පියංගුකතිස්ස 3. නාගදීපය 4. කදුරුගොඩ විහාරය 5. කලන්දක විහාරය (.....)

33. මීට වසර 13000 කට ඉහත ලංකාවේ විසූ මානවයා බාර්ලි වගා කළ බවට සාධක හමුවන ස්ථානය කුමක්ද?
1. පොතාන 2. රත්නපුරය 3. ඉරණමඩුව 4. හෝර්ටන් තැන්න 5. කිතුල්ගල බෙලිලෙන (.....)

34. සීතාවක රාජධානියේ ආරම්භක පාලකයා කවුරුන්ද?
1. හත්වන බුවනෙකබාහු 2. මද්දුම බණ්ඩාර 3. සීතාවක රාජසිංහ
4. සේනාසම්මත වික්‍රමබාහු 5. මායාදුන්නේ (.....)

35. දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා අරමුණු කරගනිමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිට වූ ආණ්ඩුකාරවරයා කවුරුන්ද?
1. වෙස්ට් රිජ්වේ. 2. හෙන්රි වෝඩ් 3. හර්කියුලීස් රොබින්සන්
4. විලියම් ග්‍රෙගරි. 5. ආතර් ගෝර්ඩන් (.....)

- **අංක 36 සිට 40 දක්වා තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 වන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| | **පළමු වැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 36 | උඩරංචාමඩම පාසල් භූමියෙහි ශිලා මංජුසා සොහොන් රැසක නටඹුන් දක්නට ලැබේ. | ඇහැළේපොළ මහ අධිකාරම්තුමා විසින් කන්නසාමි කුමරු ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් උඩරට රජ කරවන ලදී. (.....) |
| 37 | පළමුවන විජයබාහු රජුගේ විදේශ ප්‍රතිපත්තිය පොළොන්නරු රාජධානියේ පරිහාණියට හා බිඳවැටීමට හේතු විය. | විජයබාහු රජතුමා කාලිංග වංශික තිලෝක සුන්දරි කුමරිය විවාහ කරගැනීමත් තම සහෝදරිය පාණ්ඩ්‍ය කුමාරයෙකුට විවාහ කරදීමත් නිසා බිහිවූ කාලිංග පාණ්ඩ්‍ය බල අරගලය පොළොන්නරුවේ බිඳවැටීමට හේතුවිය. (.....) |
| 38 | මහනුවර යුගයේදී ආවාහ විවාහ කටයුතු සමාන කුලයන් අතර පමණක් සිදුවිය. | කන්දේ නුවර ප්‍රදේශයේ ඉස්ලාම් ආගමික මධ්‍යස්ථානයක් පැවති බව රොබට් නොක්ස්ගේ වාර්තාවේ සඳහන් වේ. (.....) |
| 39 | මුල් අවධියේ දී ආසියාකරයේ වෙළඳ කටයුතුවලදී ලන්දේසින් ඉංග්‍රීසීන් සමග සාමයෙන් කටයුතු කරන ලදී. | කිවු ලිපියට අනුව ලන්දේසි ආණ්ඩුකාර ෆන් එංගල් බෙක් ශ්‍රී ලංකාවේ මුහුදු වඩ ප්‍රදේශ ඉංග්‍රිසියට පවරනලදී. (.....) |
| 40 | පොන්නම්බලම් රාමනාදන් මහතා විසින් යාපනයේ හිංදු විද්‍යාලය ආරම්භ කරන ලදී. | නිශ්ශංකමල්ල රජුට මෙරට සිංහාසනයට ඇති අයිතිය පිළිබඳ තොරතුරු ගල්පොත ලිපියේ දක්නට ලැබේ. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 25 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය ............................

## ලංකා ඉතිහාසය II

**උපදෙස්**

- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

### A කොටස

01. ඔබට සපයා ඇති ලංකා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | කනගරායන් ආරු | 2. | කප්පකන්දර නදී | 3. | දිඹුලාගල |
| 4. | ගම්පොල | 5. | උතුරු මැද පළාත | 6. | යෝධ වැව |
| 7. | පදවිය වැව | 8. | මීගමුව | 9. | දඹකොළපටුන |
| 10. | පොතාන | 11. | ගාල්ල | 12. | කෝට්ටේ |

(ල. 12)

### B කොටස

01. ''ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම මෙරට ඉතිහාසය ගොඩනැගීම සඳහා බෙහෙවින් උපකාරී විය'' පහත සඳහන් මාතෘකා යටතේ ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම මෙරට ඉතිහාසය ගොඩනැගීමට ලබාදුන් දායකත්වය පිළිබඳ සාකච්ඡා කරන්න.
   (i) ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර භූගෝලීය පිහිටීමේ ප්‍රධාන ලක්ෂණ 3ක් නම් කරන්න. (ල. 3)
   (ii) ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නයේ පිහිටා තිබීම මෙරට දේශපාලන ඉතිහාසය හැඩගැසීමට බලපෑ අයුරු සැකෙවින් විස්තර කරන්න. (ල. 8)
   (iii) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන්ව පිහිටා තිබීම මෙරට ඉතිහාසය හැඩගැසීමට බලපෑ අයුරු විස්තර කරන්න. (ල. 5)

03. ''ලිවීම ආරම්භ කිරීමට පෙර තිබූ යුගය ප්‍රාග් ඓතිහාසික යුගයයි'' ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය යන්න හඳුන්වා එහි තාක්ෂණ භාවිතයේ සිදු වූ පරිණාමය පිළිබඳ විස්තර කරන්න. (ල. 16)

04. ''ශ්‍රී ලංකාව තුළ පළමුවරට මධ්‍යගත පාලනයක් ගොඩනගනු ලැබුවේ දුටුගැමුණු රජතුමා විසිනි''
   (i) රෝහණ රාජ වංශයේ ආරම්භකයා නම් කරන්න. (ල. 1)
   (ii) රෝහණ රාජ්‍ය එක්සත් කිරීම සඳහා එහි පාලකයින් ගත් ක්‍රියාමාර්ග 3ක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 7)
   (iii) දුටුගැමුණු රජතුමා ශ්‍රී ලංකාව තුළ මධ්‍යතන පාලනයක් ගොඩනැගූ අයුරුත් එම පාලනය තහවුරු කොට පවත්වාගෙන ගිය අයුරුත් පැහැදිලි කරන්න. (ල. 8)

05. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (i) මහා වංසය
   (ii) පොළොන්නරු රාජධානියේ බිඳ වැටීම.
   (iii) හයවන පැරකුම් රජු
   (iv) ශ්‍රී ලංකාවේ බුදු සසුන පිහිටවීම හා ව්‍යාප්තිය. (එක් කොටසකට ලකුණු 8 බැගිනි)

## C කොටස

06. 'උඩරට නව රාජ වංශයක ආරම්භක පාලකයා පළමු වන විමලධර්මසූරිය රජුය''
   (i) පළමුවන විලධර්මසූරිය රජුගේ පියා කවුරුන්ද? (ල. 1)
   (ii) පළමුවන විමලධර්මසූරිය රජුගේ මුල් නම හා භෞතීස්ම නාමය කුමක්ද? (ල. 2)
   (iii) ඔහුගෙන් ඉටුවූ ආගමික සේවාවන් තුනක් හා ආර්ථික සේවාවන් දෙකක් නම් කරන්න. (ල. 5)
   (iv) පළමු විමලධර්මසූරිය රජු රාජ්‍යත්වයට පත්වීමේදී මුහුණදුන් අභියෝග ජයගත් අන්දම සාකච්ඡා කරන්න. (ල. 8)

07. පෘතුගීසීන් හට ශ්‍රී ලංකාවේ දේශපාලන කටයුතුවලට මැදිහත්වීමට අවස්ථාව උදාවූ අයුරු උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 16)

08. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය පිළිබඳව පහත සඳහන් මාතෘකා යටතේ සාකච්ඡා කරන්න.
   (i) මුහුදුබඩ ප්‍රදේශ පාලනය
   (ii) උඩරට අල්ලා ගැනීමට අවශ්‍ය වීමට හේතු.
   (iii) ශ්‍රී ලංකාවේ උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයට යටත්වීමට බලපෑ සාධක. (ල. 16)


09. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (i) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ ලන්දේසි පාලනය.
   (ii) 1848 දෙවන නිදහස් අරගලය
   (iii) බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථික සමාජීය වෙනස්කම්.
   (iv) මිෂනාරී ව්‍යාපාරයට එරෙහි බෞද්ධාගමික පුනරුදය. (එක් කොටසකට ලකුණු 08 බැගින්)

**දෙවන වාර පරීක්ෂණය - 2019**
**ලංකා ඉතිහාසය - 13 ශ්‍රේණිය**
**පිළිතුරු - 1 කොටස**

| | | | |
|---|---|---|---|
| **01.** - 5 | **11.** - 5 | **21.** - 5 | **31.** - 4 |
| **02.** - 3 | **12.** - 1 | **22.** - 2 | **32.** - 2 |
| **03.** - 2 | **13.** - 5 | **23.** - 5 | **33.** - 4 |
| **04.** - 1 | **14.** - 4 | **24.** - 4 | **34.** - 5 |
| **05.** - 5 | **15.** - 3 | **25.** - 5 | **35.** - 1 |
| **06.** - 3 | **16.** - 2 | **26.** - 5 | **36.** - 3 |
| **07.** - 2 | **17.** - 2 | **27.** - 1 | **37.** - 5 |
| **08.** - 1 | **18.** - 1 | **28.** - 3 | **38.** - 2 |
| **09.** - 3 | **19.** - 4 | **29.** - 4 | **39.** - 1 |
| **10.** - 2 | **20.** - 1 | **30.** - 2 | **40.** - 4 |

**11 කොටස.**

## A කොටස



## B කොටස

02. (i) තැනිතලා වෙරලබඩ - අඩතැන්න
ගංගා හා ගංගා නිම්න, මධ්‍ය කඳුකරය, කලපු හා වරාය.

(ii) විවිද ජනකොටස් සංක්‍රමණය.
වාණිජ කටයුතු දියුණු වීම.
වෙළඳුන් මෙරට දේශපාලන බලය අල්ලාගැනීම. උදා: සේන ගුත්තික.
දේශාටකයින් / සංචාරකයින් පැමිණීම. පෘතුගීසි/ලන්දේසි/ඉංග්‍රීසි පැමිණීම.
ආක්‍රමණ. මිත්‍ර සබඳතා. විවාහ සබඳතා

(iii) ස්වාධීන රාජ්‍යයක් ලෙස වර්ධනය වීම. (දේශපාලන/ආගමික/සමාජ/සංස්කෘතික)
ලංකාවටම ආවේණික සංස්කෘතියක්.
ඉන්දියාවට එල්ල වූ ආක්‍රමණවල බලපෑමෙන් නිදහස් වීම.
ථෙරවාද බුදු දහම සුරක්ෂිත වීම.

03. ලිඛිත ඉතිහාසයක් ආරම්භ වීමට පෙර යුගය. වසර 12500 වීම. ක්‍රි.පූ. 600 දක්වා කාලය.
* කොටස් දෙකකට බෙදෙන බව.
ප්‍රාග් ඓතිහාසික ගල් යුගය. පූර්ව ඓතිහාසික යුගය.
* පූර්ව ප්‍රාග් ඓතිහාසික ගල් යුගය :
තාක්ෂණය, ශිලා තාක්ෂණය මත රඳා පැවතීම, මුල් යුගයේ රළු ශිලා මෙවලම්, දෙවනුව ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම්, ගල්වර්ග / තාක්ෂණික ක්‍රමය / (වෙර පහර / පීඩන ශල්කනය)
* පූර්ව ඓතිහාසික යුගය :
මැටි වළං තාක්ෂණය - නිපදවීම, වර්ණ කිරීම, මැටි ඔරු, මැටි පබළු නිපදවීම.

04. (i) මහානාග යුව රජු
(ii) ගෝඨාභය රජු - යුධ ක්‍රියාමාර්ග මගින් දසබෑ රජුන් පැරදවීම.
කාවන්තිස්ස - විවාහ සබඳතා මගින් කැළණිය හා මලය දිනාගැනීම.
- ආගමික කටයුතු මගින් සේරු / සෝම / ලෝහ රාජ්‍ය දිනාගැනීම.
(iii) දුටුගැමුණුගේ පුරෝගාමීන් රෝහණය එක්සේසත් කළ අයුරු
සේනා සංවිධානය කළ අයුරු
සටන් මෙහෙයවූ අයුරු
එලාර හා භල්ලුක පරාජයට පත්කිරීම.

තහවුරුකරගත් අයුරු - එළාරට ගෞරව දැක්වීම, භල්ලුක පරාජය කිරීම, දස මහා සේවකයින්ට (පරුමකයින්ට) තනතුරු ලබාදීම, බුදු දහමට අනුග්‍රහ දැක්වීම.

05. (i) මහා වංසය හඳුන්වා එහි ප්‍රබලතා හා වැදගත්කම විස්තර කිරීම.
(ii) දුබල පාලකයින් බලයට පත්වීම.
කාලිංග හා පාණ්ඩ්‍ය පෙළපත් අතර බල අරගලය.
පැරකුම් රජුගේ සෙනෙවි වරුන්ගේ ක්‍රියාකලාපය.
ආර්ථික පරිහානිය, කාලිංග මාඝගේ ආක්‍රමණය.
(iii) කෝට්ටේ හයවන පැරකුම්ගේ ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික සාහිත්‍ය වැදගත්කම විස්තර කිරීම.
* ලංකාව අවසාන වතාවට එක්සේසත් කිරීම. * යාපා පටුන ජයගැනීම. * ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මර්ධනය. * පිරිවෙන් ඉදිකිරීම හා අනුග්‍රහය. * සාහිත්‍ය අංශයෙන් ඉතා දියුණු යුගයක් වීම. * අද්විරරාම පටුන ජයගැනීම.
(iv) මහින්දාගමනය, අරිට්ඨ කුමරු ඇතුළු ශ්‍රී ලාංකිකයන් පැවිදිවීම. * මහමෙව්නා උයන පූජා කිරීම. * ථූපාරාමය ඉදිකිරීම. * දහ අට කුලයක පිරිස පැමිණීම. * අනුලාදේවිය සසුන්ගත වීම. * වෙහෙර විහාර ඉදිකිරීම/රාජ්‍ය අනුග්‍රහය. * බුද්ධාගම රාජ්‍ය ආගම ලෙස පිළිගැනීම. * මහා විහාරය/අභයගිරිය/ජේතවනය මූලිකකර අධ්‍යාපනය දියුණුවීම.* මහායාන බලපෑම. * නිකාය බෙදීම. * දිවයින පුරා පැතිරයාම.

## C කොටස

06. (i) වීරසුන්දර බණ්ඩාර
(ii) කොනප්පු බණ්ඩාර- ඔස්ට්‍රියාවේ දොන් ජුවන්
(iii) ආගමික : * බුදු දහම වැළඳ ගැනීම. * දළදා මාලිගය ඉදිකිරීම. * බුරුම දේශයෙන් උපසම්පදාව වැඩම කරවීම. * වෙහෙර විහාර අළුත්වැඩියාව.
ආර්ථික : * යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීම. * ගොවිතැන දියුණු කිරීම. * කපුවගාව දියුණු කිරීම. * වඩි ලුණු කර්මාන්තය දියුණු කිරීම.
(iv) බෞද්ධයෙකු නොවීම : බුදු සමය වැළඳ ගැනීම.
රාජ්‍ය උරුමයක් නොමැතිබව - කුසුමාසන දේවිය විවාහකර ගැනීම.
බිඳ වැටුණු බුදු දහම නගා සිටුවීම - ඉහත උදාහරණය
ආර්ථිකය නගා සිටුවීම - ඉහත උදාහරණය
සීතාවකින් එල්ල වූ තර්ජන - පරාජයකිරීම.
පෘතුගීසීන්ගෙන් එල්ල වූ තර්ජන - පරාජය කිරීම දන්තුරේ / බලන සටන

07. * පෘතුග්‍රීසීන් ලංකාවට පැමිණෙන විට ලංකාව බෙදී තිබූ අයුරු
* විජයබා කොල්ලය.
* vii බුවනෙකබාහු ඉංග්‍රීසීන්ට සහයදීම.
* බුවනෙකබාහු හා සීතාවක මායාදුන්නේ අතර ගැටුම්
* උඩරටපාලකයින් පෘතුගීසි සහය ගැනීම.
* යාපන රාජ්‍ය අල්ලා ගැනීම. ආදී තොරතුරු ඇසුරෙන්.

08. (i) මදුරාසි පාලනය, ද්විත්ව පාලනය, කිරීටයේ පාලනය
(ii) * දේශ සීමා ආරක්ෂා කිරීමට හමුදාංක දෙකක් යෙදවීමට සිදුවීම.
* ත්‍රිකුණාමලය මාර්ගයේ ඉදිකිරීමට උඩරට රජු අවසර නොදීම.
* උඩරට රජු කඩවත් වලදී බදු අයකිරීම.
* ප්‍රංශ ජාතිකයින්ගේ සහය ලබාගනු ඇතැයි සැකය.
* මුහුදුබඩ වැසියා උඩරට රජු තමන්ගේ රජු ලෙස පිළිගැනීම.
* මුහුදුබඩ කැරළිවලට උඩරට රජු සහය වීම.
(iii) රජුගේ, රදලවරුන්ගේ හා ඉංග්‍රීසීන්ගේ ක්‍රියාකලාපයන් විස්තර කරන්න.

09. උචිත ලෙස ලකුණු ලබාදෙන්න.